Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# "සියම් නිකායේ ආරම්භය හා වර්ධනය" (මහනුවර යුගයේ මැද භාගයේ සිට 2500 බුද්ධ ජයන්තිය දක්වා.)

*ජී.ඩී.රුවනි නිසංසලා*[1]

**සංක්ෂේපය**

16 වන සියවසේ සිට මෙරට සම්බුද්ධ ශාසනයේ පරිහානිය ක්‍රම ක්‍රමයෙන් පැවැති අතර 18 වන සියවස මධ්‍ය භාගය වන විට මෙරටින් උපසම්පදාව සහමුලින්ම තුරන් විය.. භික්ෂූන් වහන්සේලා ශ්‍රමණ ධර්මයෙන් මිදී දරු පවුල් රකිමින් දුශ්ශීල ජීවිතයක් ගත කළ අතර පිරිහීමට පත්ව පැවැති ශාසනය රැක ගැනීමට වැලිවිට සරණංකර හිමියන් විසින් විශාල පරිශ්‍රමයක් දරන ලදි. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහය මත මෙරට උපසම්පදාව පිහිටුවීම සඳහා භික්ෂූන් වහන්සේ වැඩම කරවා ගැනීමට කටයුතු කරන ලදි. වැලිවිට සරණංකර සංඝරාජ සාමණේරයන් ඇතුළුව බිහි වූ සිල්වත් සමාගම විසින් පරිහානියට පත්ව පැවති ශාසනය නඟා සිටුවීමට කටයුතු කරන ලදි. එනම් නැතිව ගිය ශාසනික ප්‍රතිපදා ඉස්මතු කිරීමට උපසම්පදාව නැවත මෙරට ස්ථාපිත කිරීමට පුරෝගාමිත්වය ලබා දෙන ලදි. මේ වන විට උපසම්පන්න භික්ෂූන් මෙරට නොසිටි අතර උපසම්පන්න භික්ෂූන් විදේශීය රටකින් කැඳවාගෙන ඒම සඳහා සරණංකර සාමණේරයන් මූලිකත්වය ගෙන දූත පිරිස් පිටත් කර ඇත.

සියම් දේශයට අවස්ථා තුනකදී දූත පිරිස් පිටත් කර යැවීමෙන් මෙරටට උපසපන් භික්ෂූන් වැඩමවා ගෙන ඒමට ක්‍රියා කරන ලද අතර පළමු හා දෙවන අවස්ථාවන්හිදී උත්සාහය අසාර්ථක වූව ද තෙවන වර සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට හැකි විය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලවා ලන්දේසි නෞකාවක් ලබාගෙන විල්බාවේ ප්‍රමුඛ පට්ටිපොළ අතපත්තුවේ ලේකම්, ඇල්ලෙපොළ වෙඩික්කාර ලේකම්, ආයිත්තාලියද්දේ මුහම්දිරම්, ඊරියගම මුහම්දිරම් යන දූත පිරිස පඬුරු සන්දේශ සමඟ සියම් දේශයට පිටත් කරන ලදි. ලන්දේසින් ලබා දුන් "තාර්කා " නම් නෞකාවෙන් මෙම දූත පිරිස ත්‍රිකුණාමල වරායෙන් සියමය බලා පිටත් වූහ. වෙලගෙදර ඇමති සමඟ මෙහෙකරුවන් තෙවිසි දෙනෙක් ද ලන්දේසි නැවියන් සමඟ පිටත් කරන ලදි. මෙහි ප්‍රතිඵලයක් ලෙස උපාලි හිමිපාණන් වහන්සේගේ මූලිකත්වයෙන් ප්‍රථමවරට එනම් ක්‍රි. ව. 1753 දී ඇසළ මස පුන් පොහෝ දින උපාලි තෙරුන් ඇතුළු සියම් භික්ෂූන් විසින් පළමුවන උපසම්පදා විනය කර්මය සිදුකරන ලදි. මේ ආකාරයට ආරම්භ වූ සියම් නිකාය පසු කාලීනව වර්ධනයට පත්විය.

උපසම්පදා භික්ෂූන් ලක්දිව නොමැති වූ යුගයක වැලිවිට සරණංකර සංඝරාජ මා හිමියන්ගේ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස සියම් නිකාය ආරම්භ වී ලක්දිව පුරා ව්‍යාප්ත වූයේ ද යන අරමුණු පදනම් කරගෙන, ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය උපයෝගී කරගෙන මෙම පර්යේෂණය සිදු කරනු ලැබිණි. සියම් දේශයෙන් උපසපන් භික්ෂූන් වැඩමවා, සියම් නිකාය ආරම්භ කර දීපව්‍යාප්ත කිරීම වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන්ගේ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස සිදුවිය.

ප්‍රමුඛ පද- නිකාය, උපසම්පදාව, සිල්වත් සමාගම, දූත පිරිස, සියම් දේශය.

1ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,ශ්‍රී ලංකාව